# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2073/12 – 2018 මැයි 30 වැනි බදාදා – 2018.05.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

05 වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, 245, සූරියපාළුව උතුර සහ 245 බී, සූරියාපාළුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සූරියපාළුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/මහ/2016/349 හා 2016.08.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. කැබලි අංක බී121 – **කෝන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0013**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: කැබලි අංක බී119, බී122, බී123 සහ බී124; දකුණට: කැබලි අංක බී123, බී124 සහ බී125; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

02. කැබලි අංක බී202 – **බටඅත්තදෙනිය කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0121**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස, පාර සහ කැබලි අංක බී201; නැගෙනහිරට: කැබලි අංක බී201; දකුණට: කැබලි අංක බී203 සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි කුඹුර; බටහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

*මගේ යොමු අංකය:* 4-3/7/2016/එච්ඩබ්ලිව්/216.
2018 මාර්තු මස 27 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර', රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

06 - 611

1A – G27753 – 12 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*